# 2.1 ග්‍රාමීය සංවර්ධන ප්‍රවේශයක් වශයෙන් සහභාගීත්ව සංවර්ධනය (කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තෝරාගත් ගමක් ඇසුරින් කරන ලද අධ්‍යයනයක්)

ප්‍රේමා පොඩිමැණිකේ
ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

## ABSRACT

ආර්ථික සංවර්ධනය තුළ විවිධ අසමතුලිතතා විද්‍යාමාන වේ. විශේෂයෙන් ශ්‍රී ලංකාව වැනි තුන්වැනි ලෝකයේ රටවල පුද්ගලයින් අතර, සමාජ පන්තීන් අතර, ජනවාර්ගික කණ්ඩායම් අතර මෙම අසමානතා ප්‍රකාශ වේ. අසමානතා අවම කරලීමේ අරමුණින් නිදහසින් පසු කාලය තුළ අනුගමනය කරන ලද රාජ්‍ය සංවර්ධන ප්‍රවේශ මාර්ගයන් රාශියක් වන අතර ප්‍රාදේශීය වශයෙන් පවත්නා අසමානතා අඩු කරලීම අරමුණු කරගත් " සහභාගිත්ව සංවර්ධනය " එවැනි එක් ග්‍රාමීය සංවර්ධන ප්‍රවේශයකි.

ගතවූ කාල පරිච්ඡේදය තුළ ග්‍රාමීය සංවර්ධනය මූලික කොටගෙන දියත් කරන ලද සම්ප්‍රදායික සංවර්ධන ප්‍රවේශයන් තුළින් ඉහළ සිට පහළට ආඥාදායක ස්වරූපයෙන් ගලාගිය සංවර්ධන ක්‍රියාදාමයක් තුළින් මෙරට ග්‍රාමීය සංවර්ධනය සඳහා ප්‍රමාණවත් දායකත්වයක් ලබා දී නොමැත. ක්‍රම සම්පාදකයින් විසින් කොතරම් සැලසුම් සකස් කළත් තවමත් ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ආර්ථිකය පසුගාමී තත්වයක පැවතීම කෙරෙහි සංවර්ධන ප්‍රවේශයන්ගේ බලපෑමක් පවතින්නේද යන්න විශ්ලේෂණය කළ යුතුව ඇත.

එබැවින් මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වූයේ නිදහසින් පසු කාලය තුළ අනුගමනය කෙරුණු රාජ්‍ය සංවර්ධන ප්‍රවේශ මාර්ගයන් තුළින් ග්‍රාමීය ජනතාවගේ සංවර්ධනය සඳහා කවර දායකත්වයක් ලැබී තිබේද, එය ප්‍රමාණවත්ද යන්න පරීක්‍ෂා කිරීමයි.

මෙම අධ්‍යයනය සඳහා උපයෝගී කරගත් දත්ත මූලාශ්‍රයන් ප්‍රධාන වශයෙන් තුන් වර්ගයක ලා සැලකිය හැකිය. අධ්‍යයනයේ තේමාවට සෘජුවම හෝ වක්‍රව අදාළ කර ගත හැකි ප්‍රකාශිත ග්‍රන්ථ, ලිපි ලේඛන, වාර්තා, සංඛ්‍යා ලේඛන ආදිය එක් කොටසකි. රජයේ කාර්යාල හා වෙනත් ආයතන වල පරිපාලන කටයුතු වලට සම්බන්ධ ලිපි ගොනු සහ වෙනත් විස්තර ලේඛන, අනෙක් කොටස වන අතර තෝරා ගත් ග්‍රාමීය ප්‍රදේශය (පොන්නිලම) තුළ කරන ලද ක්‍ෂේත්‍ර සමීක්‍ෂණයෙන් ලබා ගත් දත්ත තුන්වැන්නයි.

සිදු කරන ලද අධ්‍යයනයට අනුව අනාවරණය වූයේ නව සංවර්ධන ප්‍රවේශයක් ලෙස හඳුන්වා දෙන ලද " සහභාගිත්ව සංවර්ධනය " සාම්ප්‍රදායික සංවර්ධන ප්‍රවේශයෙන් බැහැරව ග්‍රාමීය ජනතාව තුළින්ම නිර්මාණය වී ප්‍රජා ශක්තීන් ඔප් නංවමින්, ප්‍රජාවන් විසින්ම ක්‍රියාත්මක කරනු ලැබූ ක්‍රියාවලියක් ලෙස සාර්ථකත්වයට පත්වී ඇති බවයි. ඒ අනුව ජනතාව පෙරට වඩා සමාජානුයෝජනය විමත්, වඩාත් ශුභදායි ලෙස ග්‍රාමීය ජනතාවගේ ආකල්පමය පරිවර්තනයක් සිදුවීමත් නිසා මෙම ප්‍රවේශය සංවර්ධන උපාය මාර්ගයක් ලෙස ශ්‍රී ලංකාව වැනි රටවල භාවිතය මගින් සාර්ථක ප්‍රතිඵල ලබාගතහැකි බව පැහැදිලි විය.